# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**අංක 1,823 - 2013 අගෝස්තු මස 08 වැනි බ්‍රහස්පතින්දා - 2013.08.08**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී.)

# IV (ආ) වැනි කොටස - පළාත් පාලනය

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත )


| | පිටුව |
|---|---|
| තනතුරු-ඇබෑර්තු ... ... ... ... | 1738 |
| විභාග, විභාග ප්‍රතිඵල ආදිය ... ... ... ... | — |
| පළාත් පාලන නිවේදන ... ... ... ... | 1740 |
| අතුරු ව්‍යවස්ථා ... ... ... ... | — |
| පළාත් පාලන සහා ඡන්ද ආඥාපනත යටතේ දැන්වීම ... | — |
| ආදායම් හා වියදම් පිළිබඳ ප්‍රකාශන ... ... ... | — |
| අයවැය ලේඛන ... ... ... | — |
| දේපළ විකිණීම් ... ... ... | — |
| විවිධ දැන්වීම් ... ... ... | — |


**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

## වැදගත් නිවේදනයයි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයකම මුල් සතියේ දී පළ කරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා දැන්වීම් භාරගැනීම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතුය. නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි ***ගැසට් පත්‍රය*** **පළ වූ දින සිට තෙමසකට** පසුව භාරගනු නොලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කරන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* පළ කරනු ලබන දිනට සති දෙකකට පෙර එනම්, 2013 අගෝස්තු මස 30 වැනි දින පළ කෙරෙන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2013 අගෝස්තු මස 16 වැනි දින දහවල් 12.00ට හෝ ඊට පෙර තැපෑලෙන් හෝ ගෙනවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතු ය.

**2006 අංක 19 දරන ඉලෙක්ට්‍රොනික ගනුදෙනු පනත - 9 වැනි වගන්තිය**

*" යම් ප්‍රකාශනයක්, රීතියක්, නියෝගයක්, නියමයක්, අතුරු ව්‍යවස්ථාවක්, නිවේදනයක් හෝ වෙනත් කිසිවක් ගැසට් පත්‍රයේ පළ කළ යුතු බවට යම් පනතකින් හෝ නීති ප්‍රඥප්තියකින් විධිවිධාන සලස්වා ඇති අවස්ථාවක, ඒ රීතිය, නියෝගය, නියමය, අතුරු ව්‍යවස්ථාව, නිවේදනය හෝ වෙනත් දෙය ඉලෙක්ට්‍රොනික ස්වරූපයේ වන ගැසට් පත්‍රයක පළ කරනු ලැබුවහොත් ඒ විධිවිධානය සම්පූර්ණ කර ඇත්තාක් සේ සැලකිය යුතුය."*

**පී. එච්. එල්. වී. ද සිල්වා,**
රජයේ මුද්‍රණාලයාධිපති. *(වැ.බ.)*

2013 ජනවාරි මස 01 වැනි දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.

*මෙම ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

 - B 80756— 3,400(2013/08)
F 1 –

# තනතුරු - ඇබෑර්තු

## පානදුර ප්‍රාදේශීය සභාව

පානදුර ප්‍රාදේශීය සභාවේ පහත සඳහන් තනතුරු පුරප්පාඩු සඳහා පානදුර ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ ස්ථිර පදිංචිකරුවන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ :-

(i) රියැදුරු :

පුරප්පාඩු 01

01. *අධ්‍යාපන සුදුසුකම් :*

*(අ)* අවම වශයෙන් අටවැනි ශ්‍රේණිය/නව වැනි වසර සමත් විය යුතු ය.

02. *වෙනත් සුදුසුකම් :-*

(1) තනතුරුවල ස්වභාවය මත රථ පැදවීම පිළිබඳ මෝටර් රථ කොමසාරිස් ජනරාල් විසින් නිකුත් කරන ලද බලපත්‍රයක් හා නිපුණත්වය පිළිබඳ සහතිකයක් ලබා සිටිය යුතු වීම හා මෝටර් රථ බලපත්‍රය ලැබීමෙන් පසු අවම වශයෙන් වසර 03ක පළපුරුද්ද ලබා තිබිය යුතු ය;

(2) අවම උස අඩි 05ක් විය යුතු ය;

(3) දිවා කාලයේ දී හා රාත්‍රී කාලයේ දී සේවයේ යෙදීම පිණිස ශාරීරික වශයෙන් සුදුසු තත්වයක සිටිය යුතු අතර මනා ඇස් පෙනීමක් තිබිය යුතු ය;

(4) මහා මාර්ග නීති සංග්‍රහය පිළිබඳ මනා දැනුමක් තිබිය යුතු ය;

03. *රියැදුරු තනතුර සඳහා අවශ්‍ය වෙනත් සුදුසුකම් :-*

(i) අයදුම්කරු පරම්පරාවෙන් හෝ ලියාපදිංචිවීමෙන් ශ්‍රී ලංකා පුරවැසියෙකු විය යුතු ය;

(ii) දණ්ඩ නීති සංග්‍රහය යටතේ උසාවියකින් දඬුවම් ලැබූවකු නොවිය යුතු ය;

(iii) රජයේ හෝ පළාත පාලන සේවයෙන් පහකරනු නොලැබූ අයෙකු විය යුතු යි;

(iv) රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 44/90 යටතේ විශ්‍රාම ලැබූවෙකු නොවිය යුතු යි;

(v) යහපත් චරිතයකින් හා මනා ශරීර සෞඛ්‍ය තත්ත්වයකින් යුත් අයෙකු විය යුතු යි;

(vi) අයදුම්පත කැඳවන දින වන විට පූර්වාසන්න වසර 03ක කාලයක් පානදුර ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ ස්ථිර පදිංචියක් තිබිය යුතු ය.

04. ඉහත තනතුරු සඳහා ඉල්ලුම්පත් භාර ගැනීමේ දිනට ඇතුළත් මාසයේ සිට පූර්වාසන්න මාසයේ අවසාන දිනට අවුරුදු 18ට නොඅඩු අවුරුදු 45ට නොවැඩි විය යුතු ය. දැනට සේවය කරන සේවකයින් වෙනුවෙන් උපරිම වයස් සීමාව බලපානු නොලැබේ.

05. *වැටුප් පරිමාණය :*

(i) රියැදුරු

මාසික රු. 12,470-10x130 - 10 x 145-10 x 160-12 x 170 -රු.18,860/=

(කාර්යක්ෂමතා කඩඉම හතරවන (රු.12,860) වාර්ෂික වැටුප් පියවරට එළඹීමට පෙර)

06. *බඳවා ගැනීම :*

ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයකින් හා නිපුණත්වය මැනීමේ පරීක්ෂණයක් මගින්.

07. *සේවයේ නියුක්ත කරවීමේ කොන්දේසි :*

(i) මෙම තනතුර ස්ථිර ය. විශ්‍රාම වැටුප් සහිතව තුන් අවුරුදු පරිවාස කාලයකට යටත්ය;

(ii) වැන්දඹු අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමයට දායක විය යුතු ය;

(iii) දැනටමත් මෙම ආයතනයේ ආදේශක, අනියම් හෝ තාවකාලික සේවය කරන අයදුම්කරුවන් සම්බන්ධයෙන් ප්‍රමුඛතාවයක් දෙනු ලැබේ.

මෙම අයදුම්පත් කැඳවීමෙන් පසු හෝ ඒ අතරතුරදී හෝ බඳවා ගැනීම් ප්‍රමාද කිරීම හෝ වෙනස් කිරීම සහ මෙම නිවේදනය අවලංගු කිරීම ආදී සියලු බලතල ප්‍රාදේශීය සභාවේ ලේකම් සතු වේ.

වෘත්තීය තොරතුරු සමඟ සම්පූර්ණ ජීව දත්ත ඇතුළත් අයදුම්පතක් අදාළ සියලු සහතිකවල පිටපත් සමගින් 2013.08.30 වැනි දින හෝ එදිනට පෙර "ලේකම්, පානදුර ප්‍රාදේශීය සභාව, වාද්දුව" ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් යොමු කරන්න.

ලේකම්,
පානදුර ප්‍රාදේශීය සභාව,
වාද්දුව.

08-398/1

## පානදුර ප්‍රාදේශීය සභාව

පානදුර ප්‍රාදේශීය සභාවේ පහත සඳහන් තනතුරු පුරප්පාඩුව සඳහා බස්නාහිර පළාත් සභා බල ප්‍රදේශය තුළ ස්ථිර පදිංචිකරුවන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

01. *තනතුරු නාමය :* *පුරප්පාඩු ගණන*
පුස්තකාල උපස්ථායක (සහයක) 01

02. *වැටුප් පරිමාණය :*

රු. 11,730-10x120 - 10 x 130-10 x 145-12 x 160 -රු.17,600/=
මෙම වැටුප් පරිමාණයේ 12 පියවර ආරම්භක පියවර වේ.

03. *අධ්‍යාපන සුදුසුකම් (IIශ්‍රේණිය සඳහා) :*
අධ්‍යාපන පොදු සහතික පත්‍ර සාමාන්‍ය පෙළ විභාගයේ එක්වරකදී කවර හෝ විෂයන් 06ක් සමත්විය යුතු වේ.

04. *වයස් සීමාව .-* අවුරුදු 18-45 අතර

05. *වෙනත් සුදුසුකම් :-*

(i) අයදුම්කරු පරම්පරාවෙන් ශ්‍රී ලංකා පුරවැසියෙකු විය යුතු ය;

(ii) දණ්ඩ නීති සංග්‍රහය යටතේ උසාවියකින් දඬුවම් ලැබූවකු නොවිය යුතු ය;

(iii) රජයේ හෝ පළාත් පාලන සේවයෙන් පහකරනු ලැබූවෙකු නොවිය යුතු ය;

(iv) රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 44/90 යටතේ විශ්‍රාම ලැබූවෙකු නොවිය යුතු ය;

(v) අයදුම්පත් කැඳවන දිනය වන විට පූර්වාසන්න වසර 05ක කාලයක් බස්නාහිර පළාත් සභා බල ප්‍රදේශයේ පදිංචි අයෙකු විය යුතු ය;

(vi) පානදුර ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ ස්ථිර පදිංචිකරුවන්ට වැඩි ප්‍රමුඛතාවයක්ලබා දෙනු ලැබේ.

06. සේවයේ නියුක්ත කරවීමේ කොන්දේසි :

(i) මෙම තනතුර ස්ථිර ය. විශ්‍රාම වැටුප් සහිතය;

(ii) වැන්දඹු අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමයට දායක විය යුතු ය;

(iii) දැනටමත් මෙම ආයතනයේ ආදේශක, අනියම් හෝ තාවකාලික හෝ සේවය කරන අයට ප්‍රමුඛතාවයක් දෙනු ලැබේ.

උපරිම වයස් සීමාව (අවුරුදු 18-45) ඔවුන් හට බලපානු නො ලැබේ.

මෙම අයදුම්පත් කැඳවීමෙන් පසු හෝ ඒ අතරතුරදී හෝ බඳවා ගැනීම් ප්‍රමාද කිරීම් හෝ වෙනස් කිරීම සහ මෙම නිවේදනය අවලංගු කිරීම ආදී සියලු බලතල ලේකම් සතු වේ.

වෘත්තීය තොරතුරු සමග ජීව දත්ත ඇතුළත් අයදුම්පතක් අදාළ සියලු සහතිකවල පිටපත් සමගින් 2013.08.30 වැනි දින හෝ එදිනට පෙර "ලේකම්, පානදුර ප්‍රාදේශීය සභාව, වාද්දුව" ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් යොමු කරන්න.

ලේකම්,
පානදුර ප්‍රාදේශීය සභාව,
වාද්දුව.

08-398/2

# පළාත් පාලන නිවේදන

## බණ්ඩාරවෙල මහ නගර සභාව

1952 අංක 6 දරන පළාත් පාලන ආයතන (සම්මත අතුරු ව්‍යවස්ථා) පනත

**"ප්‍රජා මූල සංවිධාන විසින් කළමනාකරණය කරනු ලබන ග්‍රාමීය ජල සම්පාදන ක්‍රම අතුරු ව්‍යවස්ථා"**

1952 අංක 6 දරන පළාත් පාලන ආයතන (සම්මත අතුරු ව්‍යවස්ථා) පනතේ 2 වගන්තිය යටතේ පැවරී ඇති බලතල ප්‍රකාරව, ඌව පළාත් සභාවේ පළාත් පාලන විෂය භාර ගරු අමාත්‍යවරයා විසින්, 1952 අංක 6 දරන පළාත් පාලන ආයතන (සම්මත අතුරු ව්‍යවස්ථා) පනතේ 2 වන වගන්තිය යටතේ සාදනු ලැබ, 2013 ජනවාරි 22 වැනි දිනැති අංක 1974/12 දරන, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ (අතිවිශේෂ) IV(අ) වැනි කොටස /පළාත් සභා කොටසේ ඌව පළාත් සභාවේ පළාත් සභා නිවේදන යටතේ ප්‍රකාශයට පත් කරනු ලද්දා වූ "ප්‍රජා මූල සංවිධාන විසින් කළමනාකරණය කරනු ලබන ග්‍රාමීය ජල සම්පාදන ක්‍රම අතුරු ව්‍යවස්ථා මාලාවේ අංක 1 සිට 25 දක්වා වූ අතුරු ව්‍යවස්ථා බණ්ඩාරවෙල මහා නගර සභා බල ප්‍රදේශයට අදාළ කර ගැනීම පිණිස 1952 අංක 06 දරන පළාත් පාලන ආයතන (සම්මත අතුරු ව්‍යවස්ථා) පනතේ 2 වන වගන්තියේ (3) වැනි උප වගන්තියේ සඳහන් විධිවිධානවලට යටත්ව බණ්ඩාරවෙල මහා නගර සභාව විසින් පිළිගැනීම සුදුසු බවට තීරණය කරන ලද බැව් මෙයින් ප්‍රකාශයට පත් කරනු ලැබේ.

එච්. එම්. ජේ. හේරත්,
නාගරික කොමසාරිස්
බණ්ඩාරවෙල මහා නගර සභාව.

2013 ජූලි මස 04 වැනි දින,
බණ්ඩාරවෙල පිහිටි,
බණ්ඩාරවෙල මහා නගර සභා කාර්යාලයේ දී ය.

08-445

---

## මහනුවර මහ නගර සභාව

ශ්‍රීමත් කුඩා රත්වත්ත මාවතින් හැරියන අතුරු මාර්ගය

**මහනුවර මහ නගර සභාව වෙත පවරා ගැනීම සඳහා වූ දැන්වීමයි**

ගඟවට කෝරලය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, මහනුවර මහ නගර සභා සීමාවේ ශ්‍රීමත් කුඩා රත්වත්ත මාවතෙන් පටන් ගන්නා, බලයලත් මිනින්දෝරු පී. එච්. ටී. ද සිල්වා මහතාගේ 2012.09.18 දිනැති අංක 1836 දරන පිඹුරේ දිනය දැක්වෙන, උතුරට වරිපනම් දේපළ අංක 319,319/1,319/2,319/2/1/1, 319/5 ද, දකුණට වරිපනම් දේපළ අංක 319/6,319/7,319/8, 321 ද, බස්නාහිරට වරිපනම් අංක 319/5 සහ නැගෙනහිරින් ශ්‍රීමත් කුඩා රත්වත්ත මාවත යන මායිම් තුළ පිහිටා ඇති පර්චස් 18.30ක් පමණ වූ ශ්‍රීමත් කුඩා රත්වත්ත මාවතින් පටන්ගන්න අතුරු මාර්ගය මහනුවර මහ නගර සභාවට පවරා ගැනීම, 2012.07.26 වැනි දින අංක 8(39) දරන සභා සම්මුතිය අනුව තීරණය කර ඇත.

මෙම මාර්ගය මහනුවර මහ නගර සභාව වෙත පවරා ගැනීම සම්බන්ධව දැන්වීම පළවී මාසයක කාලයක් තුළ විරෝධතා ඇත්නම් නාගරික කොමසාරිස්, මහ නගර සභාව, මහනුවර යන ලිපිනයට දන්වා එවන ලෙස මෙයින් දන්වා සිටිමි.

එසේ විරෝධතාවයක් ඉදිරිපත් නොවුනහොත් මහනගර සභා ආඥාපනතේ 48 (1), (2), (3,),(4) වන උප වගන්තිය යටතේ මහනුවර මහ නගර සභාව වෙත මෙම මාර්ගය පැවරෙන බවට මෙයින් දැනුම් දෙනු ලැබේ.

චන්දන තෙන්නකෝන්,
මහනුවර නාගරික කොමසාරිස්.

08-288

---

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.